පුවත් වාර්තාවන්හි නිරවද්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා සාධාරණ ප්‍රයත්නයක් ගැනීම, මාධ්‍යකරණයේදී ජනමාධ්‍යවේදීන් පිළිපැදිය යුතු ආචාර ධර්මයකි. එනිසාම තමන් පුවත් ලබාගැනීමට භාවිතා කරනා මූලාශ්‍රයන්ගේ විශ්වසනීයත්වය තහවුරු කර ගැනීම සහ බහු මූලාශ්‍ර භාවිතා කිරීම වැදගත් වේ. නමුත් මෙම ආචාර ධර්මය ආරක්ෂා කිරීමට සෑමවිටම ජනමාධ්‍යවේදීන් උත්සාහ නොකිරීම කණගාටුවට කරුණකි.

උදාහරණයක් ලෙසින්, අප්‍රේල් 28 වන දින මව්බිම පුවත්පතේ මුල් පිටුවේ "කරුගේ කතාවට සුමන්තිරන් කිපෙයි" යන සිරස්තලය යටතේ පළවූ පුවත දැක්විය හැක. එහි සඳහන් වන්නේ තමන් තවදුරටත් පාර්ලිමේන්තුවේ කථානායක නොවන බව කරු ජයසූරිය මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීමේදී පිළිගැනීම සම්බන්ධයෙන් සුමන්තිරන් මහතා විසින් ඔහුට දෝෂාරෝපණය කොට ඇති බවයි. එසේම ඔහු එය පිළිනොගත්තේ නම් පාර්ලිමේන්තුව කැඳවීම වැනි කටයුතු වලදී ඉදිරියේදී යම් වාසියක් ගැනීමට ඉඩ තිබූ බව සුමන්තිරන් මහතා ප්‍රකාශ කළ බවද එහි සඳහන් වේ.

කෙසේ නමුත් අභ්‍යන්තර ආරංචි මාර්ග මූලාශ්‍ර ලෙසින් දක්වමින් ඉදිරිපත් කොට ඇති මෙම පුවත සම්බන්ධයෙන් අප විසින් කරු ජයසූරිය මහතාගෙන් කළ කරුණු විමසීමේදී ඔහු ප්‍රකාශ කොට සිටියේ එය සාවද්‍ය බවයි. ඒ පිළිබඳව කරුණු විමසීම සඳහා අප විසින් සුමන්තිරන් මහතාව සම්බන්ධ කරගත් විට ඔහු විසින් කියා සිටියේද පුවත්පත දක්වන ආකාරයේ කිසිදු දෝෂාරෝපණය කිරීමක් හෝ අදහස් පළ කිරීමක් එම දින සිදු නොවූ බවයි. මේ සම්බන්ධයෙන් කරුණු විමසීම සඳහා අප විසින් කිහිප වරක් මව්බිම පුවත්පත සම්බන්ධ කර ගත්තද, ඔවුන්ගෙන් සාර්ථක කරුණු දැක්වීමක් ලබාගැනීමට අපහසු විණි. එසේම මෙම පුවත සම්පූර්ණයෙන්ම සාවද්‍ය, හිතාමතාම ගොතන ලද එකක් බව හිටපු කතානායක කරු ජයසූරිය මහතා විසින් ඒ සම්බන්ධයෙන් අප්‍රේල් 28 දින මාධ්‍ය වෙත නිකුත් කරන ලද ප්‍රකාශයේ අවධාරණය කෙරී ඇත.
මෙය බොහෝ දෙනෙකුගේ අවධානයට ලක්වන මාතෘකාවක් වනවා පමණක් නොව, දේශපාලනික වශයෙන්ද ප්‍රතිරූපයන්ට හානි සිදුකළ හැකි පුවතක් බව නොකිවමනායි. එනිසාම මෙවන් පුවතක විශ්වසනීයත්වය තහවුරු කර ගැනීම අත්‍යාවශ්‍ය වෙයි.

සියලුම පාර්ශවයන්ගේ කරුණු දැක්වීම් සැලකිල්ලට ගැනීමේදී, මව්බිම පුවත්පත මෙහිදී සාවද්‍ය පුවතක් පළ කිරීම ඔස්සේ මාධ්‍ය ආචාර ධර්මයන් උල්ලංඝනය කොට ඇති බව අපට වටහා ගැනීමට සිදුවේ. යම් හෙයකින් මව්බිම පුවත්පත තමන් පළ කළ පුවත නිවැරදිය යන ස්ථාවරයේ පිහිටා සිටින්නේ නම් ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කළ යුතුවේ. එසේත් නැතිනම් සාවද්‍ය පුවතක් පළ කිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන්ට කණගාටුව ප්‍රකාශ කිරීම ඔවුන්ට මීළඟට ගත හැකි ක්‍රියාමාර්ගයයි. ඔවුන් එම ආචාර ධාර්මික ක්‍රියාමාර්ගයන්ගෙන් එකක් ගනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වෙමු.

මූලාශ්‍ර: https://mcusercontent.com/e5e1192127653987d107e6f98/files/7a85621c-6ed9-43cd-bb9a-880865635fdc/2020.04.28_Karunu_Pahadili_Kiriemy_%E0%B6%BB%E0%B7%80_%E0%B6%AD_%E0%B6%AD_%E0%B6%B1_%E0%B7%80_%E0%B6%AF%E0%B6%B1%E0%B6%BA.pdf

**#MediaEthicsSL #lka #SinhalaPress #News #Mawbima**